වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ දැනට පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

තනතුර -ජ්‍යෙෂ්ඨ පරීක්ෂක

**පුරප්පාඩු සංඛ්‍යාව - 02**

**සේවා ගණය** - කණිෂ්ඨ කළමනාකාර (JM 1-2)

**වැටුප් ක්‍රමය** - රු.43,355/-,10x755/-,18x1,135/--= රු.71,335/-(මාසික ) + රජයේ අනුමත දීමනා

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 02/2016 හි 11 උපලේඛණය අනුව පහත පරිදි වැටුප් ගෙවනු ලැබේ.

| වර්ෂය | 2019 | 2020 |
|---|---|---|
| වැටුප | රු. 38.862 | රු. 43.355 |

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 හි උපලේඛන 11 අනුව වැටුප් ගෙවනු ලැබේ.

**සුදුසුකම් -**

අ)විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/ජීව විද්‍යාව/කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබාතිබීම

හෝ

ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරළත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම

හෝ

ඇ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ ) හත්වැනි(07) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

ඇ).තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සමඟ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ඉ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ-) පස්වන (05) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සමඟ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ඊ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවෙකු වීම

හෝ

පොල් සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයන්හි 11 ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ(05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස-** අවුරුදු .22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වෙනත් -**

i ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**ප්‍රතිලාභ -**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල අනතුරු රක්ෂණාවරණය
3. සේවක අර්ථසාධක අරමුදල: සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

අයදුම්කරුවන්ගේ වර්තමාන රැකියාව, වැටුප් විස්තර, කලින් දරණ ලද තනතුරු, සේවය කරන ලද කාල සීමාව, සමඟ අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබා ගතහැකි ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම සහ ලිපිනයන් ඇතුළත්ව අයදුම්කරුගේ සම්පූර්ණ විස්තර සහිතව පිළියෙල කරන ලද අයදුම්පත උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2019.09.26 දින හෝ ඊට පෙර එවිය යුතුය.( අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.)

රජයේ දෙපාර්තමේන්තු/පළාත් රාජ්‍ය සේවය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානී මගින් ද පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අංශ ප්‍රධානීන් මගින්ද එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ඉහත සඳහන් සුදුසුකම් සහ සහතික පත් නොමැති හා දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් මගින් යොමු කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙහිද පළ කර ඇත.www.cda.gov.lk

සභාපති
පොල් සංවර්ධන අධිකාරිය
අංක 54, නාවල පාර,
නාරාහේන්පිට-කොළඹ 05.

Source: www.cda.gov.lk (2019.09.26)